// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2322/51 - 2023 මාර්තු මස 08 වැනි බදාදා - 2023.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**

38(3) උපවගන්තිය යටතේ වූ නියමය

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) වගන්තිය යටතේ මා විසින් පළකරන ලද අංක 2317/25 හා 2023.01.30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් කළ පරිදි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම 2023 මාර්තු මස 09 වැනි දින නොපැවැත්වෙන බවද,

මැතිවරණ කොමිෂන් සභාවේ පාලනයෙන් පරිබාහිර අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතු කොටගෙන එකී ඡන්ද විමසීමේ දිනය කල් දැමීමට සිදු වී ඇති බැව් මැතිවරණ කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව එකී කොමිෂන් සභාව විසින් මා හට උපදෙස් දී ඇති හෙයින් ද,

එකී පළාත් පාලන ආයතනවලට අදාළ නව ඡන්ද විමසීමේ දිනය වශයෙන් 2023 අප්‍රේල් මස 25 වැනි දිනය මවිසින් මෙයින් නියම කරන බවද,

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 38(3) උප වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**වසන්ත ගුණරත්න,**
තේරීම්භාර නිලධාරී,
රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය.

2023 මාර්තු මස 08 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A - G 39069 — 31 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

රත්නපුර මහා නගර සභාව

බලන්ගොඩ නගර සභාව

ඇඹිලිපිටිය නගර සභාව

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

රත්නපුර ප්‍රාදේශීය සභාව

කුරුවිට ප්‍රාදේශීය සභාව

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

ගොඩකවෙල ප්‍රාදේශීය සභාව

කහවත්ත ප්‍රාදේශීය සභාව

වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

නිවිතිගල ප්‍රාදේශීය සභාව

අයගම ප්‍රාදේශීය සභාව

කලවාන ප්‍රාදේශීය සභාව

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

කොළොන්න ප්‍රාදේශීය සභාව

EOG 03- 0109

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.